# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2199/1 - 2020 ඔක්තෝබර් මස 26 වැනි සඳුදා - 2020.10.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළෙඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2020 ඔක්තෝබර් මස 27 වැනි දින සිට ආරම්භ වන මාස 06 ක් දක්වා වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2020.07.31 දිනැති අංක 2186/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය*, 2020.09.03 දිනැති අංක 2191/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් මාළු සහ 2020.07.18 දිනැති අංක 2184/53 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් උම්බලකඩ සඳහා ප්‍රකාශිත අදාළ නියමය 2020 ඔක්තෝබර් මස 27 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 26 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

1A - PG 5202 — 570 (2020/10)

*සැ.යු. :- අති විශෙෂ ගැසට් අංක 2198/1 බාණ්ඩය 2198/59 න් අවසන් වේ.*

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

| I වැනි තීරය | | | | II වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළෙඳ භාණ්ඩය | | | | |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද |
| 1 | 03.02 | | 03.04 ශීර්ෂයේ කටු ගැල වූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, අළුත් හෝ ශීතකළ මසුන් | 10% හෝ කි.ග්‍රෑමයට රු. 200 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය |
| | 03.03 | | 03.04 ශීර්ෂයේ කටු ගැල වූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, හිමායිත මසුන් (රේගු සං. ව. සංකේතාංක 0303.54 යටතට වැටෙන මැකරල් මසුන් සහ රේගු සංකේතාංක 0303.55 යටතට වැටෙන ජැක් සහ හෝස් මැකරල් (Jack and horse mackerel- *Trachurus spp.*/ මසුන් හැර) | 10% හෝ කි.ග්‍රෑමයට රු. 200 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය |
| 2 | 03.05 | 0305.54.10 | හාල්මැස්සන් | කි.ග්‍රෑමයට රු. 1.00 |
| 3 | | 0305.52.00<br>0305.53.00<br>0305.54.90<br>0305.59.30<br>0305.59.90 | කරවල | කි.ග්‍රෑමයට රු. 127.00 |
| 4 | | 0305.59.10 | උම්බලකඩ සහ ඒ සඳහා ආදේශක | කි.ග්‍රෑමයකට රු. 302.00 |
| 5 | 07.13 | 0713.31.19 | අනෙකුත් - මුං ඇට | කි.ග්‍රෑමයකට රු. 40.00 |
| 6 | 08.04 | 0804.50.50 | මැංගුස්ටීන් - අළුත් | කි.ග්‍රෑමයකට රු. 200.00 |
| | | 0804.50.60 | මැංගුස්ටීන් - වියළි | කි.ග්‍රෑමයකට රු. 200.00 |
| 7 | 08.10 | 0810.50 | කිවිප්‍රැට් | කි.ග්‍රෑමයකට රු. 175.00 |
| 8 | | 0810.90.90 | අනෙකුත් | කි.ග්‍රෑමයකට රු. 200.00 |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.